# ප්‍රධාන දේශනය - උතුරු පළාත් ගරු ආණ්ඩුකාර
# මේජර් ජෙනරාල් ජී ඒ චන්ද්‍රසිරි
# 2013 නොවැම්බර් මස 11 වැනි දින දෙවැනි සභාවාරය
# පළමු සැසිවාරය
# උතුරු පළාත් සභාව

උතුරු පළාත් සභාව
යාපනය

## ප්‍රධාන දේශනය - උතුරු පළාත් ගරු ආණ්ඩුකාර

## මේජර් ජෙනරාල් ජී ඒ චන්ද්‍රසිරි

## 2013 නොවැම්බර් මස 11 වැනි දින දෙවැනි සභාවාරය

## පළමු සැසිවාරය

**උතුරු පළාත් සභාව**

**උතුරු පළාත් සභාව**

**යාපනය**

**උතුරු පළාත් සභාවේ ගරු සභාපතිතුමණි**

**ගරු ප්‍රධාන අමාත්‍යතුමණි**

**ගරු අමාත්‍යවරුණි**

**ගරු මන්ත්‍රීවරුණි මන්ත්‍රීවරියණි**

**සම්භාවනීය අමුත්තනි**

**නෝනාවරුණි මහත්වරුණි**

**වනක්කම්……. ආයුබෝවන්……. අස්සලාම් අලෙයික්කුම්…….**

අද දින රැස්වන පළමුවන උතුරු පළාත් සභාවේ දෙවන සැසිවාරය ඇමතීමට ලැබීම මා ලද ගෞරවයක් සහ වරප්‍රසාදයක් ලෙස සළකමි.

ගරු සභාපතිතුමා විසින් උතුරු පළාත් සභාවේ දෙවැනි සැසිවාරය කැඳවීම සහ උත්සවාකාරයෙන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් මාගේ අවංක ස්තුතිය සහ ප්‍රශංසාව ඔබතුමන්ට පුදකිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ එතුමාගේ රජය වෙනුවෙන් උතුරු පළාත් සභාවට තේරිපත් වු සියළුම නියෝජිත මහත්වරුන් හා මහත්මිය වෙත මගේ ආචාරය සහ සුභපැතුම් පුදකිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. එසේම ඔවුන් සියළු දෙනාටම පළාත් සභා නියෝජිතයන් වශයෙන් තමන්ගේ රාජකාරි හරියාකාරව කර ගැනීමට හැකිවේවායි මා ප්‍රාර්ථනා කරමි. එසේම සියළුම තේරිපත් වූ නියෝජිත මහතුන් උතුරු පළාතේ සංවර්ධනය සඳහා මධ්‍යම රජය සමග එකතු වී කළ යුතු සියළුම සංවර්ධන කටයුතු වෙනුවෙන් ඔබගේ දායකත්වය නොඅඩුව ලබාදෙනු ඇතැයි මා විශ්වාස කරමි.

ශ්‍රී ලංකා මහජනතාව වෙත සර්වජන ඡන්ද බලය හිමිවුණු කාලයේ සිටම උතුරු පළාතේ ඡන්ද දායකයින් ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති වටිනාකම හොඳින් වටහාගෙන සිටි අතර ඒ අනුව තම මහජන නියෝජිතයන් තෝරාගන්නා ලදී. කෙසේ වුවද ගැටුම්කාරී තත්ත්වය පැවති සමයේ තම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ඔවුන් හට අහිමිව ගියේය. එනමුදු එම වාතාවරණය තුළ ද තම ඡන්ද අයිතිය සඳහා කටයුතු කළ සමහර ජනතාව නොපසුබට ව තම ඡන්ද අයිතිය පාවිච්චි කරන ලදී. එම අවාසනාවන්ත කාල පරිච්ඡේදය අවසන්ව උතුරේ ජනතාව නිදහසේ තම ඡන්දය පාවිච්චි කිරීමෙන් පළාත් සභාවට පත්කරගත්තා වූ සියළුම නියෝජිත මහත්වරුන් හා මහත්මිය එම ප්‍රජාතන්ත්‍රවාදය නැමැති සම්පතෙහි නියම උරුමකරුවන් බවට පත්වනු ඇත. උතුරු පළාත් ජනතාවගේ ඡන්දයෙන් පත් වූ උතුරු පළාත් සභාව නියෝජනය කරන ඔබ සියළුම මහජන නියෝජිතයන් හට එම ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ඨ කිරීම සඳහා ඉතා විශාල වගකීමක් දැරීමට සිදුවනු ඇත.

කෙසේ වෙතත් මෙම විශේෂ අවස්ථාවේ දී අද අප භුක්ති විඳින සාමය අත්කර දීමට අති විශිෂ්ඨ නායකත්වයක් ලබා දුන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට මාගේ උත්තමාචාරය පිරිනැමීමටත්, එසේම අද අප භුක්ති විඳින සාමය අත්කර දීමට ජීවිත කැපකළ වීරෝදාර ආරක්ෂක හමුදාවන්ට සහ පොලීසියටත් මගේ උත්තමාචාරය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ විශිෂ්ඨ නායකත්වය නොතිබෙන්නට සහ ආරක්ෂක හමුදාවන්ගේ උතුම් ජීවිත කැපකිරීම් නොවන්නට විශේෂයෙන් යාපනයේ කයිතඩි වැනි ස්ථානයක මෙවැනි උත්සව සභාවක් පැවැත්වීමට අවස්ථාවක් උදා නොවන්නට ඉඩ තිබුණි. එසේම ශ්‍රී ලංකාවේ සාමය සහ සහජීවනය ස්ථාපිත කිරීම සඳහා තම ජීවිතය පුදකළ සියළුම ශ්‍රී ලාංකියන්ට මාගේ කෘතඥතාවය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ඉතා දීර්ඝ කාලයක් භීතියෙන් සහ සැකයෙන් ජීවත්වූ අප ජනතාව නිදහසේ ආශිර්වාදය අද භුක්ති විඳිමින් සිටී. ඔවුන් තමන්ගේ එදිනෙදා ජීවිතය කිසිදු පිටස්තර බලපෑමකින් තොරව ඉතා ආරක්ෂිත පරිසරයක භුක්ති විඳිමින් සිටී.

පසුගිය වසර 4 ඇතුළත උතුරු ප්‍රදේශයේ සිදු වුණු සම්පූර්ණ පරිවර්තනය සහ විශිෂ්ඨ සංවර්ධනය විශ්මය ජනකය. ගැටුම්කාරී තත්ත්වය සහමුලින්ම අප රටෙන් තුරන්කර දැමීමෙන් පසු උතුරු පළාතේ සාමකාමී පරිසරයක් තුළ ඇති වුණ අති විශාල සංවර්ධනය පිළිබඳව සහ අවසානයේදී උතුරු පළාත් සභාව ස්ථාපිත කිරීමට කටයුතු කිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමන්ට අපගේ කෘතඥ පූර්වක ස්තුතිය පිරිනැමිය යුතුය.

උතුරු පළාත් සභාවට තේරී පත්වූ නියෝජිතයන්ගේ වර්තමාන අරමුණ විය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ පළාත් සභා පනත මගින් ලබා දී ඇති බලතල අනුව තම උපරිම ශක්තියෙන් පළාතේ සංවර්ධනය සඳහා සහ මහජනතාවගේ සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීමයි.

***<u>පරිපාලනය</u>***

උතුරු පළාත් සභාව අමාත්‍යාංශ 05 කින් සමන්විත වේ. දෙපාර්තමේන්තු 17 ක් ජනතාවට සේවාවන් ලබා දීමට ස්ථාපිත කොට ඇත. එසේම තවත් ආයතන 08 ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ මග පෙන්වීම යටතේ ප්‍රධාන ලේකම්තුමිය විසින් පාලනය කරනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඊ) ව්‍යවස්ථාවට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභාවේ ප්‍රඥප්ති සැදීම සඳහා බලතල ලබා දී ඇති විෂයයන්ට අදාළ විධායක බලය ආණ්ඩුකාරතුමා විසින් සෘජුව හෝ අමාත්‍ය මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ඇත. පළාත් සභාවේ නිළධාරීන් පත් කිරීම, මාරු කිරීම සහ විනය ක්‍රියාමාර්ග ගැනීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ආණ්ඩුකාරවරයා විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ හැරුණු විට ආණ්ඩුකාරවරයාට අයත් බලතල 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහ පළාත් සභා පනත යටතේ ඔහු හට ලබා දී ඇති අතර ඒ අනුව ආණ්ඩුකාරවරයා තම රාජකාරි කටයුතු ක්‍රියාත්මක කරනු ඇත.

උතුරු පළාත පරිපාලන දිස්ත්‍රික්ක 05 කින් සමන්විත වන අතර ඒවා නම් යාපනය, කිළිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වවුනියාව වේ. එමෙන්ම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 34 කින් සහ ග්‍රාම නිලධාරි වසම් 921 කින් සමන්විත වේ. මෙම දිස්ත්‍රක්කවල මධ්‍යම රජය විසින් හඳුනාගත් සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සිදුකරනු ලබන අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු විසින් අදාළ දිස්ත්‍රික්කවල සංවර්ධන කටයුතු සහ මුල්‍ය ප්‍රතිපාදන කටයුතු පාලනය හා මෙහෙයවීම කරනු ලැබේ. එම කමිටුවල සම සභාපතිත්වය අදාළ දිස්ත්‍රික්කවල කැබිනට් අමාත්‍යවරු විසින් සහ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් දරණු ලැබේ.

**ගරු සභාපති තුමණි,**

***<u>පළාත් සභා ක්‍රමය ස්ථාපිත කිරීම</u>***

මෙම ඓතිහාසික අවස්ථාවේදී උතුරු පළාතේ පළාත් සභා ක්‍රමයේ අතීතය සම්බන්ධව කරුණු කීපයක් පෙන්වා දීමට කැමැත්තෙමි. පළාත් සභා ක්‍රමය මූලික වශයෙන් උතුරු සහ නැගෙනහිර පළාතේ පැවති ගැටුම්කාරි තත්ත්වයන් සැළකිල්ලට ගෙන ඒ සඳහා දේශපාලනික විසඳුමක් ලබාදීම අරමුණු කොටගෙන 1987 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. උතුරු නැගෙනහිර පළාත් සභාව ප්‍රථමයෙන් ස්ථාපිත කරනු ලැබුවද වසර 2 ක් වැනි කෙටි කාලයක් තුළ දී, එනම් 1991 වර්ෂයේ දී එය විසුරුවා හැරීමට සිදුවිය.

වර්ෂ 2006 ඔක්තෝබර් මස 16 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය මගින් දෙනු ලැබූ නඩු තීන්දුව අනුව උතුරු සහ නැගෙනහිර පළාත් නැවතත් වෙනම පාලනය වන කොටස් 2 ක් වශයෙන් වෙන් කරන ලදී. එසේ වුවද උතුරු පළාතේ පැවති අස්ථිර වාතාවරණය තුළ මහජනතාවගේ සර්වජන ඡන්ද බල අයිතිය හරියාකාරව ක්‍රියාත්මක කිරීමට මහජනතාවට නොහැකි විය. කෙසේ වුවද උතුරේ සාමය ස්ථාපිත කිරීමෙන් පසු වර්ෂ 2013 සැප්තැම්බර් මස 21 වන දින පවත්වනු ලැබූ සාමකාමි, නිදහස් මැතිවරණයෙන් පසුව 2013 ඔක්තෝබර් මස 25 දින සිට උතුරු පළාත් සභාව තම කටයුතු ආරම්භ කරන ලදී. පළාත් සභාවක් ස්ථාපිත කිරීමේ සත්‍ය අරමුණ ඉතා සාර්ථකව මෙම ප්‍රථම උතුරු පළාත් සභාවේ නිල කාලය තුළ දී පළාත් සභාව විසින් ක්‍රියාකාරීව පෙන්වා දෙනු ලබනු ඇති බව මා විශ්වාස කරමි.

විධායක, ව්‍යවස්ථාදායක සහ මුදල් පාලනය සම්බන්ධයෙන් පළාත් සභාවට ඇති බලතල සහ එම බලතල ක්‍රියාවට නංවන ආකාරය සම්බන්ධයෙන් වන විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පෙන්වා දී ඇත. එසේම පළාත් සභාවේ වගකීම් සහ මධ්‍ය රජයේ වගකීම් ද ඒ අකාරයෙන්ම පෙන්වා දී ඇත.

පළාත් සභාව විසින් මධ්‍යම රජයේ අනුමැතිය සහිතව ක්‍රියාත්මක කළ යුතු වැඩ කටයුතු සම්බන්ධයෙන් ද සියළුම කරුණු 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නිසියාකාරව පෙන්වා දී ඇත. එසේම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විධායක, ව්‍යවස්ථාදායක සහ මුදල් සම්බන්ධව පළාත් සභාවලට ඇති බලතල පැහැදිලිව පෙන්වා දී ඇත. ඔබව තෝරාගනු ලැබූ ඔබගේ මහජනතාව කෙරෙහි ඇති වගකීම් හරියාකාරව ඉටු කර ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ ඇතුළත් විධිවිධානත් එසේම 1987 නීතිගත වූ පළාත් සභා පනතේ විධිවිධානත් ඔබ විසින් ඉතා හොඳින් අවබෝධ කරගෙන කටයුතු කරන බව මම විශ්වාස කරමි. එසේම මෙම පළාතේ අවශ්‍යතාවයන් හොඳින් අවබෝධ කර ගැනීමත් එය රටේ අවශ්‍යතාවයන් සඳහා එක් කොට ගත හැක්කේ කෙසේද යන්න සම්බන්ධවත් මනා අවබෝධයකින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව මාගේ හැඟීමයි.

පළාත් සභාව තම පළාතේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා කටයුතු කිරීමේදී මධ්‍යම රජයේ අනුමැතිය සහ අනුග්‍රහය ද ඇතිව කටයුතු කිරීම අවශ්‍ය වන අතර ඒ සඳහා අවශ්‍ය විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත වේ. මධ්‍යම රජයේ සහයෝගය, අනුමැතිය සහ ආධාර නොමැතිව පළාත් සභාවකට තනිවම කටයුතු කිරීම අපහසුය. මධ්‍යම රජයේ සහයෝගය පළාත් සභාවකට අත්‍යාවශ්‍ය වේ. උදාහරණයක් ලෙස සෑම වසරකම තම කටයුතු කර ගැනීම සඳහා අවශ්‍ය මුදල් මධ්‍යම රජයේ භාණ්ඩාගාරයෙන් වෙන් කරවා ගැනීම පළාත් සභාවකට අත්‍යාවශ්‍ය වේ. එසේම පළාතේ ආර්ථික සහ සාමාජීය සංවර්ධනය සඳහා වෙනත් රටකින් ලබාදෙන ආධාර එම පළාතේ කටයුතු සඳහා ලබාගත හැකි වනුයේ මධ්‍යම රජය මාර්ගයෙන් පමණි.
එසේම මධ්‍යම රජයේ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව එම පළාත් සභාවට අනුමත සේවක සංඛ්‍යාව තීරණය කරනු ලබයි. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත සමගාමී ලැයිස්තුවේ ඇති විෂයයන් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සැකසීමේ දී මධ්‍යම රජයේ හා උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍යය.

එසේ හෙයින් තම අමාත්‍යාංශ විෂයයන්ට අයිති කටයුතු සම්බන්ධයෙන් උපරිම සේවයක් මහජනතාවට ලබා දීම සඳහා මධ්‍යම රජයේ එම විෂයයට අයත් අමාත්‍යාංශය සමගත් සහ පළාතේ දිස්ත්‍රික් පරිපාලනය භාරව කටයුතු කරන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමගත් නිසි සම්බන්ධතාවය සහ සහයෝගය තබා ගැනීම අත්‍යාවශ්‍ය බව මා මේ අවස්ථාවේ දී පෙන්වා දීමට කැමැත්තෙමි.

**ගරු සභාපතිතුමණි,**

***<u>සාමාජ ආර්ථික තත්ත්වය</u>***

උතුරු පළාත ශ්‍රී ලංකා භූමියෙන් 13.2% ක් ආවරණය වේ. එහි මුළු වර්ග කිලෝමීටර් ප්‍රමාණය 8846.83 කි. උතුරු පළාත දිස්තික්ක පහකින් සමන්විත වන අතර ඒවා නම් යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වවුනියා යන දිස්ත්‍රික්කයන් වේ. ඇස්තමේන්තුගත ජනගහනය 2013 මැදභාගය වනවිට මිලියන 1.207 ක් වේ. මෙම පළාත ඉතා වැදගත් කෘෂිකාර්මික කලාපයක් වන අතර ධාන්‍ය, පශු සම්පත්

සහ ධීවර කර්මාන්තය යනාදිය වැදගත් අංශ වේ. උතුරු පළාත සතුව ශ්‍රී ලංකාවේ වෙරළ තීරයෙන් 1/3 ක් සහ හෙක්ටයාර් 250,000 ක වගාකළ හැකි භූමි ප්‍රදේශයක් ඇති අතර මෙම සම්පත් වලින් වැඩි ප්‍රමාණයක දැනට ජනතාව තම ආර්ථිකමය ක්‍රියාකාරකම්වල නිරතව සිටී. කෙසේ නමුත් ගැටුම් පැවති සමයේ කෘෂිකාර්මික අංශය දළ ජාතික නිෂ්පාදනයට දැක්වූ දායකත්වය අඩු වී තිබුණි (GDP). නමුත් 2010 වසරේ සිට මෙම අංශය දළ ජාතික නිෂ්පාදනයට දක්වන දායකත්වයේ වර්ධනයක් පෙන්වමින් පවතී.

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වෙමින් පවතින **උතුරු වසන්තය** සංවර්ධන වැඩසටහන යටතේ උතුරු පළාත තුළ අද්විතීය සංවර්ධනයක් සිදුව ඇති බව රහසක් නොවේ.

2009 වර්ෂයේ මැයි මාසයේ සිට අද දක්වා උතුරු පළාතේ සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබූ සම්පූර්ණ මුදල් ප්‍රමාණය, අප රට නිදහස ලැබීමෙන් පසු වියදම් කරනු ලැබූ වැඩිම මුදල් ප්‍රමාණය බව දන්වා සිටින්නේ ඉතාමත් සතුටිනි. පසුගිය වසර 4 ඇතුළත මෙම පළාතේ සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබූ මුදල රුපියල් මිලියන 100,000 කට වඩා අධික වන අතර එය ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දින සිට 2009 වර්ෂය දක්වා පැවැති ඕනෑම ශ්‍රී ලංකා රජයක් විසින් දරණු ලැබූ මුදලට වඩා වැඩි මුදලක් බවත් සඳහන් කරන්නේ ඉතා සතුටිනි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ අධීක්ෂණය මත සියළුම අත්‍යාවශ්‍ය යටිතල පහසුකම්, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන දියුණුව, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය සහ සමාජ සුභසාධන කටයුතු සඳහා මෙම මුදල් යොදවන ලදී.

1980 ට ප්‍රථම උතුරු පළාත දළ ජාතික නිෂ්පාදනය සඳහා දැක්වූ දායකත්වය 7% කි. පසුව එය විශාල වශයෙන් අඩු වී ගියේය. ගැටුම්කාරී තත්ත්වය අවසන් වීමෙන් පසු නැවතත් ඇති වූ අති විශාල දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස 2012 වර්ෂයේ දී උතුරු පළාත දළ ජාතික නිෂ්පාදනය සඳහා දැක්වූ දායකත්වය 25.9% දක්වා වැඩිවිය.

2012 වර්ෂයේ දී සමහර පළාත් වල දළ ජාතික නිෂ්පාදනය සඳහා දැක්වූ දායකත්වය 4% ක් වූ අතර මෙය උතුරු පළාතේ ඇති වූ අතිවිශාල දියුණුවක් ලෙස පෙන්වා දිය හැකිය. මෙයින් අවබෝධ වනුයේ උතුරු පළාතේ සංවර්ධනය සඳහා කැපව කටුයතු කළහොත් අතිවිශාල දියුණුවක් ලැබීම අපහසු නොවන බවයි. මහ බැංකු වාර්තා අනුව 2011 වර්ෂයේ දී උතුරු පළාතේ ඒක පුද්ගල ආදායම වසරකට රුපියල් ලක්ෂ 2.2 ක් වූ අතර එය 2012 වර්ෂයේ දී රුපියල් ලක්ෂ 2.8 ක් දක්වා වර්ධනය විය. ඉදිරියේ දී මෙය තවත් වර්ධනය කිරීමට ගරු පළාත් සභා මන්ත්‍රීතුමන්ලා සමත් වේ යැයි මා විශ්වාස කරමි.

මේ වන විට උතුරු පළාතේ සුභසාධක කඳවුරුවල සිටි අභ්‍යන්තර අවතැන් වූ 353,272 ක් පමණ වූ ජනතාව ඔවුන්ගේ ගම් බිම්වල පදිංචි කර හමාරය. එසේම ඔවුන්ගේ ජීවිත යළි ගොඩනංවා ගැනීමට

අවශ්‍ය පහසුකම් හැකි උපරිම ආකාරයෙන් රජය අනෙකුත් ආයතනවල ද සහයෝගය ඇතිව මේ වන විට ඔවුන්ට ලබා දී ඇත.

2009 වසරෙන් පසුව ධීවර සහ පශු සම්පත් ඇතුළුව කෘෂිකාර්මික අංශය ආර්ථික ඵලදායිතාවේ පැහැදිලි වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2011 සහ 2012 යන වසර වලදී උතුරු පළාතේ වී නිෂ්පාදනය රටේ වාර්තාගත වී අස්වැන්න ලෙස වාර්තා වී ඇත. රජය විසින් ලබාදෙන අඛණ්ඩ සහයෝගය හේතුවෙන් කෘෂිකාර්මික අංශයේ ධාන්‍ය නිෂ්පාදනය, ධීවර සහ පශු සම්පත් යන අංශවල ක්‍රමක්‍රමයෙන් වර්ධනය වීමක් දක්නට ලැබෙන අතර කෘෂි නිෂ්පාදන සඳහා වෙළඳපොළ ද පුළුල් වී ඇත. ශ්‍රී ලංකා මහබැංකු වාර්තාව අනුව කෘෂිකාර්මික අංශයෙන් 2012 වසරේ දී දළ ජාතික නිෂ්පාදනයට වූ දායකත්වය (GDP) 19.6% කි. එසේම පසුගිය වසරවල ප්‍රගතිය හා සැසඳීමේ දී උතුරු පළාතේ කර්මාන්ත අංශයේ පැහැදිලි වර්ධනයක් 2012 වසරේ දී පෙන්නුම් කරයි. 2012 වසරේ දී ඇඟළුම් අංශය සංචාරක සහ ඉදිකිරීම් අංශවල කරන ලද විශාල ආයෝජනයන් නිසා 23.5% කින් පළාත් දළ ජාතික නිෂ්පාදනයට දායක වී ඇත. ඒ අනුව 2012 දී උතුරු පළාතේ දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයට වඩා කර්මාන්ත අංශයෙන් සිදු වී ඇති දායකත්වය වැඩි වී ඇති බව පෙනේ. තවද රාජ්‍ය හා පෞද්ගලික අංශ එක්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නව ව්‍යාපාර ආරම්භ කිරීම, ව්‍යාපාරික අවස්ථා සඳහා ජනතාව සවිබලගැන්වීම, කර්මාන්ත පුරයන් සහ අවස්ථා පුළුල් කිරීම යනාදිය අනාගතයේ දී මෙම අංශවල දියුණුවට ඉවහල් වන අත්‍යාවශ්‍ය සාධක වන බව සිහිපත් කරමි.

එසේම උතුරු පළාතේ සෞඛ්‍යය හා අධ්‍යාපනය යන අංශවල උන්නතිය උදෙසා ඉතා වැදගත් සැළකිල්ලක් දක්වා ඇති අතර එම අංශවල අති විශාල සංවර්ධනයක් මේ වන විට සිදු වෙමින් පවතී. කෙසේ වෙතත් නිවැරදි සැලසුම් සම්පාදනය මගින් අනාගතයේ දී මෙම සේවා දියුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු බව මාගේ හැඟීමයි.

**ගරු සභාපතිතුමණි,**

***<u>ආංශික සංවර්ධනය</u>***

2013 වර්ෂය සඳහා වන ආංශික සංවර්ධනය සහ සාධනය පිළිබඳව විශ්ලේෂණය කිරීම අවශ්‍ය වන අතර අනාගත අවශ්‍යතාවයන්ට අවශ්‍ය සේවා අවශ්‍යතා පිළිබඳව සාකච්ඡා කිරීම අත්‍යාවශ්‍ය වේ. එසේම පළාත් සංවර්ධන රාමුව සහ පළාත් ප්‍රමුඛතා අරමුණු සමග ජාතික ප්‍රතිපත්ති හා අරමුණු බැඳී ඇති ආංශික සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කිරීම ද ශ්‍රද්ධානාන්විතය.

## ***කෘෂිකර්මය***

උතුරු පළාතේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකාර්මික අංශය යි. **මහින්ද චින්තන** ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවලට නව තාක්ෂණය යොදාගනිමින් විවිධාංගීකරණය කරමින් කෘෂිකාර්මික නිෂ්පාදන දිරිගැන්වීම් කරනු ලැබේ. මේ වන විට ආසන්න වශයෙන් පළාතේ ජනතාවගෙන් 60% ක් සක්‍රියව කෘෂිකර්මාන්තයෙහි නිරතව සිටී. සීඝ්‍ර සංවර්ධනයේ ප්‍රථිඵලයක් ලෙස 2013 වසරේ දී වී අස්වැන්න මෙට්‍රික් ටොන් 233317 ක් වු අතර අතිරික්ත ප්‍රමාණය රටේ අනෙකුත් පළාත් වලට ද යවනු ලැබේ. වසර පුරා හෙක්ටයාර් 67726 ක ධාන්‍ය සහ ගෙවතු වගා කටයුතු කරනු ලබන අතර 2013 දී එළවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 122494 කි. විශේෂයෙන් මහා පරිමාණයෙන් කෙසෙල් සහ මිදි වගාකරනු ලබන අතර එහි ප්‍රථිඵලයක් ලෙස එම කටයුතුවල නියැලී ජනතාවට හොඳ වෙළඳපොළක් නිර්මාණය වී තිබේ. සමුපකාර ක්‍රමය සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය මත ඔවුන්ගේ ආදායම වර්ධනය වී ඇත. පූර්ව සහ පසු අස්වනු නාස්තිය අවමකර ගැනීම තුළින් නිෂ්පාදනය වැඩිකර ගත හැකිය. 2014 වසරේ දී ප්‍රමුඛතා ක්ෂේත්‍රවල සම්පත් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. පළාතේ වගා කළ හැකි ඉඩම්වල නව තාක්ෂණය භාවිතා කරමින් නවීන ක්‍රමවේදයන් භාවිතයට පියවර ගැනීම ප්‍රඥාගෝචර වේ.

උතුරු වසන්තය වැඩසටහන යටතේ කෘෂිකාර්මික අංශයට යන්ත්‍රෝපකරණ, පොහොර බීජ සහ වී ගබඩා ලබාදීම තුළින් එම අංශයේ දියුණුවට රජය විසින් පියවර රාශියක් ගෙන ඇත.

## ***ධීවර කර්මාන්තය***

උතුරු පළාතේ ජනතාවගේ තවත් එක් ප්‍රධාන ජීවනෝපාය ක්‍රමයක් වනුයේ වාරිමාර්ග සහ කෘෂිකාර්මාන්තය හා එකට බද්ධ වී ඇති මිරිදිය ධීවර කර්මාන්තයයි. පළාතේ මිරිදිය ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණින් ජාතික ජලජීවී සංවර්ධන අධිකාරියේ මහඟු දායකත්වයෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ මුත්තායන්කඩ්ඩු වැව ආශ්‍රිතව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන අතර කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා 2013 දි ජල ජීවී ව්‍යාප්ති කාර්යාලයක් ස්ථාපිත කර ඇත. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන දෙකක් ද පිහිටුවා ඇත. ජාතික ජලජීවී සංවර්ධන අධිකාරිය සමග එක්ව ඒකාබද්ධ ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරනු ලැබේ. මේ තුළ විවිධ වැඩසටහන් යටතේ විශාල මුදලක් උතුරු පළාතේ ආයෝජනය කර ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහයෝගිතාවය මත තිරසාර ජල සැපයුමක් තුළින් උතුරු පළාතේ ජලාශ ආශ්‍රිතව මිරිදිය කර්මාන්තය සංවර්ධනය කිරීමට හැකිවේ. ධීවරයන්ගේ සහ ධීවර සමුපකාර සමිතිවල ධාරිතා ප්‍රවර්ධන කටයුතු 2014 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුය. මිරිදිය මත්ස්‍ය සැකසුම් හා වෙළෙඳපොල අවස්ථාද 2014 දී වැඩිදියුණු කළ යුතුය.

මිරිදිය ධීවරයන්ගේ ව්‍යාප්ති සහ පුහුණු කටයුතු තවදුරටත් වැඩි දියුණු කර බලගැන්වීම තුළින් උතුරු පළාතේ මිරිදිය කර්මාන්තයේ ප්‍රවර්ධනයක් ලබාගත හැකිය. ජාතික ජලජීවී සංවර්ධන අධිකාරිය මෙන්ම වෙනත් රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන වැඩපිළිවෙල තුළින් මිරිදිය අංශයේ සීඝ්‍ර සංවර්ධනයක් කළ හැකි බව නිර්දේශ කරමි. එම දිශානතියට අනුව ඉරණමඩුකුලම්, යෝධවැව, අක්කරායන්කුලම් ආදි වැව් මිරිදිය මත්ස්‍ය කර්මාන්තයට යොදා ගැනීම සළකා බැලිය යුතුය.

රටේ මුහුදු සීමාවෙන් 1/3 ක් උතුරු පළාත සතුවේ. පසුගිය වසර හතර ඇතුළත ධීවර නිෂ්පාදන 100% කින් වර්ධනය වී ඇත. උදාහරණයක් ලෙස 2009 වසරේ දී මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 21900 ක් වූ අතර එය 2012 වසර වන විට මෙට්‍රික් ටොන් 59340 දක්වා වර්ධනය වී ඇත. බහුදින යාත්‍රා ගණන, ට්‍රෝලර් පිටත මෝටර් සවිකළ බෝට්ටු ගණන පසුගිය වසර හතර ඇතුළත වර්ධනය වී ඇත.

***<u>වාරිමාර්ග</u>***

වාරිමාර්ග අංශයට කෘෂිකාර්මික සහ මිරිදිය ධීවර කර්මාන්තය හා සමීප සම්බන්ධතාවයක් ඇත. එබැවින් උතුරු පළාතේ දහස් ගණනක් ජනතාවගේ ජීවනෝපායන් ඒ මත රඳා පවතී. **මහින්ද චින්තන** ඉදිරි දැක්මේ ඉතා පැහැදිලිව නිර්වචනය කර ඇත්තේ 2020 වසරේ දී වාරිමාර්ග අංශය කෘෂිකාර්මික සංවර්ධනයේ ප්‍රධාන නියමුවා වන අතරම ප්‍රමාණවත් ජල සැපයුමක් සමාන සහ සාධාරණ ප්‍රමාණයන්ගෙන් ලබා දීම සහ තිරසාර සහ පරිසර හිතකාමී ලෙස කාර්යක්ෂම කිරීම වේ. එබැවින් මෙම අංශය මහඟු කාර්යයක් පළාත තුළ සිදුකරනු ලබයි. මධ්‍යම ප්‍රමාණයේ වාරි යෝජනා ක්‍රම 45 ක් ද ප්‍රධාන වාරි යෝජනා ක්‍රම 09 ක් ද පළාත තුළ ක්‍රියාත්මක වේ. එමෙන්ම සුළු වැව් සහ පොකුණු 2066 ක් පමණ පළාත තුළ ඇත. අක්කර 70181 කට 2013 දී ජල පහසුකම් සපයා ඇත. 2014 වසරේ දී ප්‍රමාණවත් ජල සුරැකුම් තාක්ෂණ ක්‍රමයන් හඳුන්වා දීම සහ ජලාපවාහන සහ ගංවතුර තත්ත්වයන් පාලනය උතුරු පළාත තුළ හඳුන්වා දිය යුතුය. එම අංශයේ අනාගත ඵලදායිතාවය තවදුරටත් වැඩි දියුණු කිරීම, භෞතික සම්පත් වැඩිදියුණු කිරීම, භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම සහ ගොවිජනතාව බලගන්වමින් ජල යෝජනාක්‍රම තිරසාරව කළමනාකරණය කිරීම සහ ආයතනික සම්පත් සේවා සැපයීම කළමනාකරණය වැඩිදියුණු කළ යුතුය. එම දිශානතියට අනුව යමින් රජය විසින් ඉරණමඩු මහා පරිමාණ ජලයෝජනා ක්‍රමය උතුරු පළාතේ ජනතාව වෙනුවෙන් සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

***<u>පශු සම්පත්</u>***

**මහින්ද චින්තන** ප්‍රතිපත්ති ප්‍රකාශයේ මෙලෙස සඳහන් වේ. *"ගෘහස්ත කිරි අවශ්‍යතාවයෙන් 15% ක් පමණක් ප්‍රාදේශියව නිෂ්පාදනය කරනු ලබති. අප විසින් මෙම තත්ත්වය වෙනස් කලයුතුය. බහු ජාතික*

*සමාගම් වලට බදු සහනාධාර ලබාදෙමින් ඔවුන් පොහොසත් කරනවා වෙනුවට සෑම උත්සාහයක්ම ගෙන කිරිවලින් ස්වයංපෝෂිත වීමට කටයුතු කරමු."* උතුරු පළාතේ මෙම කර්මාන්තයේ ආයෝජනයට වැදගත් අවස්ථාවන් ඇත. මෙමගින් මෙම ක්ෂේත්‍රයේ නියැළි සිටින්නන්ට අමතර ආදායමක් ලබා ගැනීමට හැකිවනු ඇත. ආයෝජකයන් රාශියක්ම ( උදා: රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, සමුපකාර අංශය සහ ස්වෙච්ඡා සංවිධාන) මෙම ක්ෂේත්‍රය සවිබල ගැන්වීම සඳහා ඔවුන්ගේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

සතුන් ඇත්කරන්නන්ගේ සහ බෝ කිරීමේ නිෂ්පාදනයන් ව්‍යාප්ත කිරීම, එළුවන් ඇතිකරන්නන් සහ කර්මාන්තයේ පෞද්ගලික දිරිගැන්වීම සඳහා පසුගිය කාලයේ දී කටයුතු කර ඇත. මෙම ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ වඩා හොඳ පශු වෛද්‍ය සේවාවක් සලසා දීමට කටයුතු කර ඇත. රජයේ මැදිහත්වීම නිසා 2013 වසරේ දී දෛනික සාමාන්‍ය කිරි නිෂ්පාදනය ලීටර් 77000 සිට 90000 දක්වා  වර්ධනය වී ඇත.  2013 වසරේ දී කුකුල් මස් නිෂ්පාදනය 75% කින්ද බිත්තර නිෂ්පාදනය ද විශාල ලෙස වර්ධනය වී ඇත. 2014 වසරේ දී ප්‍රධාන ඉලක්කයන් ලෙස  දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 100000 දක්වාත් කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදනය ස්වයංපෝෂිත මට්ටම දක්වා වර්ධනය කිරීමත් අත්‍යාවශ්‍ය වේ. කෙසේ වෙතත් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දේශිය දියර කිරි නිෂ්පාදනය පළාත තුළ පරිභෝජනය කිරීම සඳහා ජනතාව පෙළඹවිය යුතුය. මෙම අංශය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන සංවර්ධන කේෂත්‍රයන් විය යුත්තේ අනාගතයේ දී **"ගෘහස්ථ මට්ටමින් ජීවිතයට ආහාර"** යන සංකල්පයයි. ඵලදායිතාවය වැඩි දියුණු කිරීමත්, පශු සම්පත් සහ කුකුලන් ඇතිකිරීමේ නව තාක්ෂණය භාවිතා කිරීම, සෞඛ්‍ය සම්පන්න පශු සම්පතක්, වෙළඳපොල පහසුකම්  වැඩිදියුණු කිරීම, ආයතනික ධාරිතාවයන් වැඩි දියුණු කිරීම, සත්ව ආහාර සම්පත් වැඩිදියුණු කිරීම ප්‍රශස්ථව කළ යුතුය. සත්ව නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ සමුපකාර සමිති, ගොවි සංවිධාන ග්‍රාම සංවර්ධන සමිති, අනාගතයේ දී මෙම ක්ෂේත්‍රයේ වැදගත් කාර්ය භාරයක් ඉටු කළ යුතුය.

***<u>අධ්‍යාපනය</u>***

ශ්‍රී ලංකාවේ බුද්ධිමත් පුද්ගලයන් බිහි කිරීම සඳහා අවශ්‍ය වටපිටාව සැලසීමට අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්කම් රාශියක් සිදුකර ඇත. එම නිසා උතුරු පළාතටද මෙම අවස්ථා ප්‍රයෝජනයට ගෙන ජාතික ඉලක්කයන් **මහින්ද චින්තන** ඉදිරි දැක්මට අනුකූලව ඉටුකර ගැනීමට මෙය ප්‍රයෝජනයට ගත යුතුය. දැනටමත් රජය විසින් උතුරු පළාතේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා පාසැල් 1066 අතරින් පාසැල් 983 ක් ක්‍රියාකාරි පාසැල් ලෙස වැඩි දියුණු කර තිබේ. මෙම පළාත තුළ, ජාතික පාසැල් 1000 සහ පෝෂිත පාසැල්  5000 සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පාසැල් සංවර්ධන වැඩකටයුතු රාශියක් සිදුකර ඇත.

පාසැල් 500 කට ළමා සහයෝගීතා වැඩසටහන් හඳුන්වා දී තිබේ. මෙම පළාත තුළ පාසැල් 90 ක් සඳහා **මහින්දෝදය** විද්‍යාගාර පහසුකම් ලබා දී ඇත. විවිධ මාර්ග මගින් හඳුනාගත් අවශ්‍යතා අනුව යටිතල පහසුකම් සපයා ඇත. වැඩිහිටියන්ගේ සාක්ෂරතාවය 88%ක් දක්වා වැඩි වී ඇති අතර වැඩිහිටියන්ගේ ජීවත්වීමේ ආයු කාලය අවුරු 73 දක්වා 2013 වන විට වැඩි වී ඇත. පාසැල් හැරගිය ළමුන් අඩුකිරීම හේතුවෙන් ඉහත ප්‍රතිඵල ළඟාකරගෙන ඇත. අධ්‍යාපන මට්ටම වැඩි දියුණු කිරීම සඳහා පසුගිය වසර 4 ක කාලය ඇතුළත උතුරු පළාත් සභාව සඳහා ගුරුවරුන් 1764ක් බඳවා ගැනීමට රජය විසින් පියවර ගෙන ඇත.

ක්‍රීඩා හා සංස්කෘතික අංශ ද මෙම ක්ෂේත්‍රයට අමතරව එකතු වී ඇත. වසර 2014 දී ද්විතීයික මට්ටමේ පාසැල් සංවර්ධනය කිරීම හා එයට අදාළ වන ප්‍රාථමික පාසැල් ද සංවර්ධනය කිරීමට අදාළව පාසැල් පුනරුත්ථාපනයත් ප්‍රතිසංස්කරණයත් පළාත් හා ජාතීන් අතර බැඳීමක් ඇති කිරීමත් අරමුණු කරගෙන ක්‍රියාත්මක වී තිබේ. ක්‍රීඩාව හා සංස්කෘතිය යහපත් අයුරින් දියුණු කිරීමට අනාගතයේදී පුමුඛත්වය ලබා දිය යුතුය. 2014 වර්ෂයේ දි වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට අවධානය යොමු කොට තිබේ. අනාගතයේදී ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් ලබාදීම සඳහා ගුරුවරුන්ගේ ධාරිතාවය වැඩි දියුණු කිරීම හා පාසැල් වල ඇති සෞඛ්‍ය තත්ත්වය දියුණු කිරීමට අවධානය යොමු කළ යුතුය. 2014 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශයේ උපකාරය මගින් පෙර පාසැල් අධ්‍යාපන ක්‍රමය තව තවත් දියුණු කිරීම හා ක්‍රියාත්මක කරගෙන යෑම සිදු කළ යුතුය.

***<u>සෞඛ්‍යය</u>***

යහපත් සෞඛ්‍යය අප සමාජයේ සම්පතයි. එම නිසා සෞඛ්‍ය අංශය අප සමාජයේ ඉතා වැදගත් ස්ථානයක් උසුලයි. සෞඛ්‍ය සේවයේ ඇති භෞතික හා තාක්ෂණික පසුබිම වඩා ශක්තිමත් කිරීම මහින්ද චින්තන සංවර්ධන දැක්මේ ප්‍රධාන ඉලක්කය වී තිබේ. මෙම ක්ෂේත්‍රයේ පොදු ජනතාවට වඩා හොඳ සේවාවක් ඉටු කිරීම සඳහා මානව සම්පත් හා ධනාත්මක කුසලතා සංවර්ධනය කළ යුතුය. මෙම පළාතේ මහජනයාට බටහිර හා දේශිය වෛද්‍ය ක්‍රම මගින් සෞඛ්‍ය අංශයේ සේවය ලබාදෙනු ලැබේ. පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ප්‍රාථමික හා ද්විතීයික සෞඛ්‍ය ආරක්ෂණ ආයතන, රෝග නිවාරණය මෙන්ම වැළැක්වීමේ ආයතන පාලනය කරනු ලැබේ. උතුරු පළාත් ජනතාව වෙනුවෙන් ප්‍රධාන රෝහල් 06 ක් සහ ප්‍රාදේශිය රෝහල් 52 ක්ද උතුරු වසන්තය වැඩසටහන යටතේ නැවත ප්‍රතිසංස්කරණය කර ඇත.

2013 වර්ෂයේදී සෞඛ්‍ය ආරක්ෂණය ලබා දීමේ දී උතුරු පළාත වැඩි අවස්ථාවක් ලබා ඇති අතර ඉදිරියේ දී මෙය වඩාත් හොඳින් පවත්වාගෙන යනු ඇතැයි බලාපොරොත්තු වෙමි. මහජන සෞඛ්‍ය

නිලධාරීන්ගේ පත්වීම් මගින් නැවත පදිංචි කිරීම් ප්‍රදේශවලට මහජන සෞඛ්‍ය සේවාව ලබා දී ඇත. මෙම පළාතේ පවතින ඌන පහසුකම් සහිත ගම්මාන වල ගැබිණි මාතාවන්ට හා ළමුන්ට ආරක්ෂණ සේවාවන් ලබා දී ඇති අතර එහි ප්‍රතිඵල නිසා ප්‍රධාන සෞඛ්‍ය දර්ශක වන මරණ අනුපාතිකය හා පෝෂණය යහපත් මට්ටමකට පත්ව ඇත. බෝ නොවන රෝග පාලනය කිරීමේ වසර ලෙස 2013 වර්ෂය සෞඛ්‍ය අමාත්‍යංශය මගින් නම් කර ඇත. මේ සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය කාර්යාල සෑම ප්‍රදේශයකම පවතින ජීවන මධ්‍යස්ථාන මගින් වයස අවුරුදු 35 ට වැඩි පුද්ගලයන් බෝ නොවන රෝග පිළිබඳ පරීක්ෂාවට ලක් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. 2013 වර්ෂයේ දී ඩෙංගු මර්ධන වැඩසටහන හා ග්‍රාමීය මට්ටමේ පෝෂණ වැඩසටහන ද අඛණ්ඩව ක්‍රියාත්මක වේ. 2013 වර්ෂයේ දී නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවල බෝ නොවන රෝග මර්ධනය සහ සෞඛ්‍ය නිලධාරීන්ට නවාතැන් පහසුකම් ලබා දීමටද අවධානය යොමු කර ඇත. 2014 වර්ෂයේ සෞඛ්‍ය ක්‍රම දියුණු කිරීමේදි සෞඛ්‍ය අංශය මගින් ගැබිනි මාතාවන් හා ළමාරක්ෂණ සේවය දියුණු කිරීම, බෝනොවන රෝග හා බෝවන රෝග මර්ධනය කිරීම, (CD and NCD ) ළමා උපත්, හදිසි අනතුරු සේවාව හා දැඩි සත්කාර ප්‍රතිකාර ඒකක දියුණු කිරීම ද සෞඛ්‍ය අංශයෙන් ආවරණය විය යුතුය.

***<u>පළාත් පාලනය</u>***

**මහින්ද චින්තන** සංවර්ධන වැඩසටහනට අනුව මහජනතාවගේ මූලික අවශ්‍යතාවයන් සහ පහසුකම් සතුටුදායක හා යහපත් ජීවන තත්ත්වයන් උදෙසා ලබා දීමට කටයුතු කළ යුතුය. මෙම අංශය මගින් මහජන පොදු ස්ථාන වන වෙළඳපොළ, ග්‍රාමීය මාර්ග, මහජන පොදු ස්ථාන, උද්‍යාන, ආදාහනාගාර, සුසාන භූමි, ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන හා ගව ඝාතකාගාර ආදී පහසුකම් සැපයීම ප්‍රධාන කාර්යයන් වේ. නැවත පදිංචි කල මහජනතාවගේ මූලික පහසුකම් දියුණු කිරීමට 2013 වර්ෂයේ දි ප්‍රමුඛතාවය දී ඇත. පුර නැගුම වැඩසටහන යටතේ ග්‍රාමීය මාර්ග අළුත්වැඩියාව, සනීපාරක්ෂක හා ජල සම්පාදන පහසුකම් හා ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිය ලබා දීම ද නැවත පදිංචි කිරීමේ ප්‍රදේශවලට විශේෂ පහසුකම් ලබා දීමද සිදුකර ඇත. උතුරු පළාතේ මහජනතාවගේ පහසුකම් වන වෙළෙඳපොල ඉදිකිරීම්, ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන, පුස්තකාල, මහජන ක්‍රීඩා පිටි හා ගව ඝාතකාගාර ඉදි කර ඇත. කාබනික පොහොර නිෂ්පාදනය හා අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව තාක්ෂණය හඳුන්වා දී ඇත. මේ පළාතේ පවතින පළාත් පාලන ආයතන 34 මගින් මහජන සම්බන්ධතාවය හා තීරණ ගැනීමේ හැකියාව දිගටම වැඩිදියුණු කරගෙන යා යුතුය.

***මාර්ග***

අපේ මහජනතාවට සැහීමකට පත් විය හැකි ප්‍රවාහන පහසුකම් හා මාර්ග පහසුකම් ලබාදීමට **"මහින්ද චින්තන"** ඉදිරි දැක්ම සමත් වී ඇත . උතුරු පළාතේ දළ වශයෙන් කි. මී. 1960 ක් පළාත් මහ මාර්ග හා කි. මී. 7600 ක් ග්‍රාමීය මාර්ගද දක්නට ලැබේ. උතුරු පළාත් මහ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට කි. මී. 1960 ක් සි හා ඩී පන්තියේ මාර්ග සෑදීම හා නඩත්තු කිරීමේ වගකීම පැවරී ඇත. කි. මී. 1115 සි හා ඩී පංතියේ මාර්ග වලට තාර හා බොරළු යොදා සංවර්ධනය කර ඇත. ආර්ථික සංවර්ධන අමාත්‍යංශය යටතේ දළ වශයෙන් කි. මී. 350 ක මහාමාර්ග ප්‍රතිසංස්කරණය හා කි. මී. 845 පළාත් මහාමාර්ග හා කි. මී. 1282 ග්‍රාමීය මාර්ගද ප්‍රතිසංස්කරණය කොට ඇත. 2014 වර්ෂයේ මෙම පළාතේ ගුණාත්මක මහාමාර්ග ජාලයක් නඩත්තු කිරීම, ආරක්ෂිත ප්‍රවාහනය වෙනුවෙන් මහාමාර්ග වල ආරක්ෂාව වැඩි දියුණු කිරීම, පාරිසරික බලපෑම් අඩුකිරීම හා මහා මාර්ග අංශයේ ක්‍රියාදාමයන් දියුණු කිරීම සඳහා අදාළ ආයතන ශක්තිමත් කළ යුතුය. මෙම අරමුණු කරා අදාළ ආයතන යොමු විය යුතුය.

***සංචාරක ක්ෂේත්‍රය***

සංචාරක ක්ෂේත්‍රය මෙම පළාතේ සීඝ්‍රයෙන් වැඩි දියුණු වන අංශයකි. එම නිසා විදේශ සංචාරකයන් හා දේශීය සංචාරකයන් මෙම පළාතට විශාල වශයෙන් ආකර්ශණය වේ. මෙම පළාතට මේ අංශය මගින් ඍජුව හා වක්‍රව රැකියා හා ආදායම් ලැබේ. මේ වන විට සංචාරක අංශය සංවර්ධනය කිරීම සඳහා රජය මගින් ද විවිධ මාර්ගවලින් දිරිගැන්වීම් සිදු කර ඇත. මෙම පළාතේ සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජනය සඳහා බොහෝ අවස්ථා ඇත. සංචාරක ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම මගින් සංචාරකයන්ගේ ආකර්ශණය වැඩි කිරීම හා ව්‍යාප්ත කිරීම දේශීය නිෂ්පාදන වෙළෙඳපොළ ප්‍රවර්ධනය හා මෙම ක්ෂේත්‍රයේ ආදායම් මාර්ග වැඩි දියුණුවට පියවර ගැනීම සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සැලසුම් කිරීමේ ආයතන මගින් පුළුල්ව කළයුතු බවට මා නිර්දේශ කරමි. මෙම අංශය අනාගත පරම්පරාවට වැදගත් කර්මාන්තයක් වනු ඇත.

**උතුරු පළාත් සභාවේ ගරු සභාපතිතුමණි**
**ගරු ප්‍රධාන අමාත්‍යතුමණි**
**ගරු අමාත්‍යයවරුණි**
**ගරු මන්ත්‍රීවරුණි මන්ත්‍රීවරියණි**

අවසාන වශයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසින් උතුරු පළාතේ සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද **උතුරු වසන්තය** සංවර්ධන වැඩසටහන ට අළුත් සිතුම් පැතුම් එක් කරමින් පළාතේ සංවර්ධන ක්‍රියාවලියට දායක වෙමින් ඉතා මහන්සියෙන් වගකීමෙන්, උතුම් හැඟීමෙන්

යුතුව උතුරු පළාතේ සංවර්ධනය සඳහා කටයුතු කොට උතුරු පළාත් ජනතාවට ඉතා සුභදායී අනාගතයක් ඔබ තුමන්ලා විසින් නිර්මාණය කරනු ඇතැයි මා විශ්වාස කරමි.

එසේම අද දින මා විසින් කරන ලද ප්‍රධාන දේශනයේ අඩංගු කරුණු සංවර්ධනය සඳහා ඔබ විසින් ගොඩනගනු ලබන ප්‍රධාන සැලසුම් සඳහා යොදා ගනු ඇති බවටද අප දේශයේ ස්වාධීනත්වය හා ස්වෛරීභාවය ආරක්ෂා කරමින් අපගේ ජාතික අරමුණුද සිත්හී තබාගෙන තම පළාත් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරනු ඇතැයි ද මා බලාපොරොත්තු වෙමි.

එසේම එම සැලසුම් උතුරු පළාතේ මහජනතාවගේ මතු දියුණුව සහ සංවර්ධනය සඳහා හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට හැකි වේවායි මා ප්‍රාර්ථනා කරමි.

**ස්තූතිය**